**ලිපි ගොනු අංකය : ................................**



# <u>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග ජල සම්බන්ධනයක් සඳහා පාරිභෝගිකයා බැඳෙන ගිවිසුම</u>

1974 අංක : 2 දරණ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ හා 1992 අංක : 13 දරණ සංශෝධන පනතේ සදහන් කොන්දේසිවලට හා පසුව රජය විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පනවනු ලබන කවර කොන්දේසි වලට හෝ අනුකූලවීමටත්, යම් හෙයකින් එසේ පැනවෙන කොන්දේසී හා බදුවලට අනුකූලවීමටත් මා අසමත් වුවහොත්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභිමතය පරිදි කවර අවස්ථාවකදී වුවද, මෙම සේවා සම්බන්ධතාවය විසන්ධි කරනු ලැබීමට යටත් වන බවට සම්පූර්ණ දැනුම ඇතිව සිටිමි / සිටිමු. තවද හිග මුදල් අය කර ගැනීම සඳහා මා /අප /දෙපාර්තමේන්තුව / අමාත්‍යාංශය / ආයතනය / හට විරුද්ධ නීතිමය පියවර ගැනීමට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයිතියක් ඇති බවත්, එම නීතිමය තීරණ හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමටත්, ........................................................................................................................................ පදිංචි ........................................................................................................ මම / අපි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ........................................................................................................................................ යන ස්ථානයට ජල සම්බන්ධනයක් ලබා ගැනීමට එකග වෙමි /වෙමු.

(ඉහත පනත්වල සදහන් සමහර රෙගුලාසි සහ නියෝගවල අන්තර්ගත කොන්දේසි වඩා පැහැදිලි වන ලෙස මෙසේ පහත දක්වා ඇත. එහෙත් ඒවා සම්පූර්ණමය නොවන අතර පාරිභෝගිකයන්ගේ පහසුව සදහා පමණක්ම වේ).

**ජල සැපයුම පිළිබද කොන්දේසි**

01. සපයනු ලබන ජලය අපතේ නොයැවීමට හා අයථා පරිදි පාවිච්චි නොකිරීමට වග බලා ගත යුතුයි.

02. ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරු වෙත දෙන ජල සැපයුමක් නම් එය තාවකාලික ජල සැපයුමක් වන අතර, මාස 6 න් ජල සැපයුම විසන්ධි කිරීමට යටත් වන හෙයින්, නැවත ජල සැපයුම අවශ්‍ය නම් නව ගිවිසුමකට එළඹ එය ලබා ගත යුතුය.

03. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් ජල සැපයුම හා සම්බන්ධ කාර්යයක් සඳහා බලය දෙන ලද කවර නිලධාරියෙකුට වුවද සියළු අභ්‍යන්තර ජල නල හා සවි කරන ලද උපකරණ පරීක්ෂා කර බැලීමට කවර සාධාරණ වෙලාවක වුවද ඉඩ පහසුකම් ලබාදිය යුතුය.

04. ජල සැපයුමට අදාල රජයේ දේපලක් වශයෙන් පවතින ජල මනුවේ පරිභෝජනයට අනුකූලව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිට ගෙවිය යුතු වන ජල ගාස්තු ගෙවිය යුතුය.

05. ජල සැපයුම ලබා දීම සඳහා ප්‍රධාන නලයේ සිට ජල මනුව දක්වා අවශ්‍ය සියළුම ද්‍රව්‍යයන් සඳහා යනු ලබන වියදම් මණ්ඩලය විසින් සකස් කරනු ලබන වියදම් ඇස්තමේන්තුවට ඇතුලත්ව ඇති අතර මේ සඳහා පාරිභෝගිකයා විසින් සපයනු ලබන කිසිදු ද්‍රව්‍යයක් භාර ගනු නොලැබේ. මෙම ඇස්තමේන්තුව සඳහා පාරිභෝගිකයා මුදල් යෙදෙව්වද එය මණ්ඩලය සතු දේපළක් වශයෙන් පවතී. වෙනත් පාරිභෝගියෙකුට ජල සැපයුම ලබා දීම සඳහා එම උපකරණ හා නල මාර්ග යොදා ගැනීමේ අයිතිය මණ්ඩලය සතුවේ. ඒ අනුව මණ්ඩලයේ සේවකයන් හැර වෙනත් කිසිම අයෙකු කුමන හේතුවක් මත හෝ එම උපකරණවලට හෝ නල මාර්ගවලට කිසිවක් නොකල යුතුය.

06. ඉහත සදහන් උපකරණ හා නල නැතිවුවහොත් විනාශ වුවහොත් නැත්නම් ඒවාට අලාභහානි සිදු වුවහොත් පාරිභෝගිකයා ඒ බව මණ්ඩලයට දැනුම් දිය යුතු අතර, එම අලාභහානිය උපකරණ දෝෂ නිෂ්පාදන තත්ත්වයේ හේතුවෙන් සිදු වී ඇති අවස්ථාවල හැර එවැනි හානි භාණ්ඩ අළුත්වැඩියා කිරීමට හෝ නැවත සැපයීම සඳහා යන සියළුම වියදම් පාරිභෝගිකයා විසින් මණ්ඩලයට ගෙවිය යුතුය.

07. ජල මනු කියවීම සඳහා පැමිණෙන නිලධාරින්ට මනු කියවීමට අදාල පහසුකම් සලසා දිය යුතු අතර යම්කිසි අවස්ථාවකදී ජල මනුව ක්‍රියා විරහිත වීමෙන් හෝ සටහන් ගැනීම සඳහා මණ්ඩලයේ නියෝජිතයන්ට මනුව වෙත යා නොහැකි නම් හෝ වෙනත් කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් මත ඇස්තමේන්තු බිල්පත් නිකුත් කිරීමට සිදු වුවහොත් මණ්ඩලයේ නීති රීතිවලට අනුකූලව ඇස්තමේන්තු බිල්පත් ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. නිරතුරු ඇස්තමේන්තු වන ස්ථානයන්හි මනු කියවීමට අදාල පහසුකම් සලසා දෙන ලෙස දැනුම්දී ඇතත් එලෙස කටයුතු නොකරන විට එම ජල සැපයුම /සැපයුම් විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇත

08. මණ්ඩලය සතු ජල මණුවෙන් පසුව සවි කර ඇති කිසිදු ජල නල හෝ උපකරණ නඩත්තු කිරීමේ වගකීම මණ්ඩලය භාර ගනු නොලැබේ.

09. මණ්ඩලයේ අනෙකුත් පාරිභෝගියන්ට කාර්යක්ෂම ලෙස ජලය සැපයීමට බාධා වන ලෙස අනිසි අයුරින් සැපයුමට බාධා කිරීම හෝ පීඩනය වැඩි කිරීම සඳහා මණ්ඩලීය නලයට පොම්ප සවි කිරීම වරදකි. එසේ සිදු කලහොත් අදාල ජල සැපයුම විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇති අතර ඒ සඳහා මණ්ඩලය මගින් නියම කරනු ලබන දඩයකට යටත් වීමට ද සිදු වේ.

10. එක් එක් අය ක්‍රමයන් යටතේ තමාට ලබා දී ඇති ජල සැපයුම අධි අය කිරීම් ක්‍රමයක් ක්‍රියාත්මකව පවත්නා කවර හෝ කාර්යයන් සඳහා පාරිභෝගිකයා විසින් භාවිතා නොකල යුතුය. කිසියම් පාරිභෝගියෙකුට ජල සැපයුම අධි අය ක්‍රමයකට යටත් වන පරිදි වෙනස් කලේ නම් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එබදු අධි අය ක්‍රමයකට යටත් විය යුතු දිනයේ සිට එකී අය ක්‍රමය යටතේ ජල ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා බැඳී සිටින අතර ඒ සඳහා මණ්ඩලය මගින් නියම කරනු ලබන දඩයකට යටත් වීමට ද සිදු වේ.

11. ජල සැපයුම සඳහා ගෙවිය යුතු මුදල අයපත් මගින් දන්වා යවනු ලැබූ විට ගෙවීමට බැඳී සිටින අතර එම මුදල සම්පූර්ණයෙන් නොගෙවුවහොත් හෝ මෙහි සදහන් ජල සැපයුම් පිළිබද කොන්දේසි කිසිවක් උල්ලංගනය කරනු ලැබුවහොත් ජල සැපයුම සිදලීමේ අයිතිය මණ්ඩලය සතුවේ. මෙම ජල සම්බන්ධනයට අමතරව තවත් ජල සම්බන්ධන ඇත්නම් ඒවා විසන්ධී කර පසු හෝ පෙර හිග මුදලක් ඇත්නම් මෙම ජල සම්බන්ධනය අදාල ගිණුමෙහි හෝ මෙම ස්ථානයට අදාල වෙනත් ගිණුමක හිගයක් නොමැති වුවද එම ජල සැපයුම /සැපයුම් විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇත.

12. ජල පාරිභෝගිකයා, නිවාස හිමියා හෝ වෙනත් අයෙකු වෙත වුවද විසන්ධි කරන ලද ජල සැපයුම නැවත ලබා දෙන්නේ නම් එසේ කිරීමට කටයුතු කරනු ලබන්නේ ඒ සඳහා වැය වන සියළුම වියදම් හා හිඟ ගාස්තු සියල්ල පාරිභෝගිකයා විසින් ගෙවීමට කටයුතු කිරීමෙන් පසුව පමණී.

13. මණ්ඩලය විසින් තමාට සපයා දී ඇති ජල සැපයුම පාරිභෝගිකයා විසින් අනිසි අන්දමින් භාවිතා කිරීමට හා සපයා ඇති ජල සැපයුමෙන් කොටසක් වෙනත් අයෙකුට සැපයීම හෝ විකිණීම දඩුවම් ලැබිය හැකි වරදකි. මෙහිදී මණ්ඩලයේ ක්‍රියාපටිපාටියට අනුව දඩ මුදලක් අය කරනු ලැබේ.

14. තාවකාලිකව හෝ ස්ථිරව ජල සැපයුම විසන්ධි කර ගැනීමට යම් පාරිභෝගිකයෙකුට අවශ්‍ය වූ විට ඒ බව යටත් පිරිසෙන් සතියකට කලින් ලිඛිතව දැනුම දිය යුතු අතර සැපයුම සිදලන දිනය දක්වා සපයනු ලබන ජලය සඳහා ගෙවීම් කිරීමට පාරිභෝගිකයාට සිදු වනු ඇත.

15. ජල බිල්පත් නිසි පරිදි ගෙවා නොමැති අවස්ථාවලදී ජල සැපයුම විසන්ධි කිරීමේ දැන්වීම් බිල්පතේම මුද්‍රණය කර හෝ තැපෑලෙන් හෝ එම ස්ථානයේ අලවා හෝ අදාල පාරිභෝගිකයා දැනුවත් කර විසන්ධි කිරීමට යන අවස්ථාවේදී අදාල පුද්ගලයන් සිටින / නොසිටින අවස්ථාවලදී ජල සැපයුම මීටරයෙන් / ප්‍රධාන නලයෙන් විසන්ධි කිරීම හෝ අවශ්‍ය වේ නම් පොලිසිය සමග අදාල පරිශ්‍රයට ඇතුලත්ව ජල සැපයුම විසන්ධි කිරීමට බලය මණ්ඩලය බලය ඇත.

16. මූලික ඉඩම කොටස් වලට බෙදා නව වරිපනම් අංක දෙන ලද අවස්ථාවක අයිතිකරු විසින් එහි නව වරිපනම් අංක හා නව අයිතිකරුවන්ගේ තොරතුරු මණ්ඩලයට ලිඛිතව දැනුම දිය යුතුයි. එසේ කිරීමට අපොහොසත් වුවහොත් කිසිම වගකීමකින් තමා නිදහස් නොවේ. මුල් ඉඩම හෝ ඉන්පසු වෙන් කල කොටසක් අන්සතු කලාට පසුව මුල් ඉඩමෙහි මණ්ඩලයට අයවිය යුතු හිගයක් වේ නම් එම හිග මුදල ගෙවීමට බැදී සිටින බව දැනුවත්ව සිටිය යුතුය.

17. අදාල ජල සැපයුම ඇති ස්ථානය විකුණනු ලැබුවහොත් නව අයිතිකරු විසින් ඇප තැන්පත් ගෙවීමෙන් අනතුරුව නව ගිවිසුමක් අත්සන් කල යුතුව ඇත. එසේ නොකලහොත් එම ජල සැපයුම විසන්ධි කිරීමට බලය මණ්ඩලය සතුය.

18. ජල සැපයුම මාපකයෙන් විසන්ධි කිරීමෙන් පසු එය ප්‍රධාන නලයෙන්ද විසන්ධි කිරීමට මණ්ඩලයට බලය ඇති අතර, එම ජල සැපයුම විසන්ධි කර දින 365 ක් ඇතුලත නැවත සන්ධි කර නොගත්තේ වුවද පසුව එම ජල සම්බන්ධනය තමාට අවශ්‍ය වන්නේ නම් ඒ බව ලියාපදිංචි තැපෑලෙන් විසන්ධි කර දින 365 ක් ඇතුලත දන්වා එවිය යුතුය. ගිණුම අවලංගු කිරීමෙන් පසු නැවත ජල සැපයුම අවශ්‍ය නම් නව ජල සැපයුම් ගාස්තු හා පෙර ගිණුමේ හිග මුදල් ගෙවා නල සමබන්ධනය ලබා ගතු යුතුය.

19. ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ පාරිභෝගිකයාට ලිඛිතව දැනුම් දීමෙන් පසු ජල සැපයුම පිළිබද ඉහත සදහන් කොන්දේසිවලින් සමහරක් හෝ නැතහොත් අය ක්‍රමය යටතේ වූ ගාස්තු කලින් කලට සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට මණ්ඩලයට හැකිවේ. එබදු සංශෝධන හෝ වෙනස් කිරීම හෝ එකී දැනුම් දීමේ සදහන් දිනයේ සිට ක්‍රියාත්මක වේ.

20. මණ්ඩලයේ සේවා නලයේ සිට ජල මනුව දක්වා අති ජල නල පද්ධතිය අවහිර වන සේ හෝ හිතා මතා හෝ යම් නීතිමය හේතුවක් මත අවහිර වන්නේ නම් එම ජල සම්බන්ධනය විසන්ධි කිරීමේ බලය මණ්ඩලය සතුවේ.

21. බදු කරුවෙකු /කුලී නිවැසියෙකු විසින් ජල සැපයුමක් ලබා ගෙන ඇති අවස්ථාවක අදාල කාලය අවසාන වීමත් සමග ඒ බව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත දන්වා අදාල සැපයුම විසන්ධි කරවා ගැනීමට හෝ දේපලේ හිමිකරුගේ නමින් සැපයුම වෙනස් කිරීමට අවශ්‍ය පියවර බදු කරු / කුලී නිවැසියා විසින් ගත යුතු අතර, එසේ නොවන අවස්ථාවලදී අදාල බදු කරු / කුලී නිවැසියා අදාල සැපයුම සම්බන්ධයෙන් තව දුරටත් වගකීමෙන් බැදේ.

22. පරිශ්‍රය වෙත ලබා ගන්නා ප්‍රධාන ජල සැපයුමෙන් මනු ගත අතුරු ජල සම්බන්ධන වෙත වෙන වෙනම ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී නිශ්චිත කාලසීමාවක් තුල ප්‍රධාන මාපකයේ සටහන් පරිභෝජනය හා අතුර මාපකයන් හි සටහන් වන පරිභෝජනයේ එකතුව අතර ඌනතාවයක් පවතින්නේ නම් එකී පරිභෝජනය ඌනතාවය අතුරු මාපකවලට අයත් ගිණුම්වලට සමානුපාතික පදනමක් යටතේ ඇතුලත් කර එම ගාස්තු නිරවුල් කිරීමට හෝ එකී පරිභෝජන ඌනතාවයට අදාල ගාස්තු වෙනම ගිණුමක් යටතේ නිරවුල් කිරීමටත් එකී ගාස්තු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී අතුරු මාපකවලට අයත් හිඟ මුදල් නිරවුල් කර තිබුනද ප්‍රධාන සැපයුම විසන්ධි කරනු ලැබීමට යටත් වන බවට දැනුවත්ව සිටීමටත්,

23. මණ්ඩලයේ ජලය බෙදාහැරීමේ පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය සම්බන්ධ පරීක්ෂා කිරීමක් හෝ වෙනත් හදිසි අළුත්වැඩියා කටයුතු හෝ වෙනත් කිනම් අන්දමක කාර්යයන් සදහා ජල සැපයුම තාවකාලිකව නතර කිරීමට මණ්ඩලයට හැකියාව ඇති අතර මේ නිසා සිදු වන යම් පාඩුවක් වේ නම් මණ්ඩලය ඒ සඳහා වග කියනු නොලැබේ. හැකි සෑම අවස්ථාවකදීම මණ්ඩලය පාරිභෝගිකයා වෙත කලින් දැනුම් දීමක් කරනු ඇත.

24. ජල සැපයුම ලබා ගැනීමේදී ඉදිරිපත් කරන ලියවිලි හා අනෙකුත් විස්තර නිවැරදි හා සත්‍ය ලෙස ඉදිරිපත් කිරීමට බැදී සිටින අතර, එම විස්තර ව්‍යාජ හා / හෝ සාවද්‍ය බවට පසු කලෙක තහවුරු වුවහොත් මෙම ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කිරීමට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට බලය ඇත. විසන්ධිකිරීම නිසා මා/අප හට වන අලාභහානි සදහා මණ්ඩලය වග නොකියනු ලබයි.

.................................................................................................................... වන මම / අපි ඉහත සදහන් කොන්දේසි සියල්ල කියවා තේරුම් ගත් බවත්, එම කරුණු සියල්ල හා වරින් වර පනවනු ලබන කවර හෝ කොන්දේසි වලට හෝ අනුකූලව ක්‍රියා කිරීමට එකඟ වන බවත් මෙයින් ඔබ වෙත දන්වා සිටිමි / සිටිමු..

**ගෘහ :**

සම්පූර්ණ නම : ..........................................................................

ලිපිනය : ..........................................................................

අයිතිකරු / බදුකරු / කුලිකරු බව : ..........................................................

ජාතික හැදුනුම්පත් අංකය : ..........................................

අත්සන : ..........................................

දිනය : ..........................................

**ගෘහ නොවන:**

ව්‍යාපාරයේ / සාමාගමේ / රාජ්‍ය ආයතනයේ / හවුල් ව්‍යාපාරයේ

නම : ..........................................................................

ලිපිනය : ..........................................................................

ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ / සාමාගමක් නම් අධ්‍යක්ෂකගේ / රාජ්‍ය ආයතනයක් නම් එහි ප්‍රධානි හෝ බලයලත් අයගේ (නිල මුද්‍රාව තබන්න)

1.සම්පූර්ණ නම : ..........................................................................

ජාතික හැදුනුම්පත් අංකය : ..........................................

අත්සන : ..........................................

දිනය : ..........................................

2.සම්පූර්ණ නම : ..........................................................................

ජාතික හැදුනුම්පත් අංකය : ..........................................

අත්සන : ..........................................

දිනය : ..........................................

(මණ්ඩලයේ නිලධාරියා ඉදිරියේදි අත්සන් නොකරයි නම් පහත කොටස් අදාල වේ)

සාක්ෂිකරුවන් (2 - දෙදෙනකු) :

1.සම්පූර්ණ නම : ..........................................................................

ජාතික හැදුනුම්පත් අංකය : ..........................................

අත්සන : ..........................................

දිනය : ..........................................

2.සම්පූර්ණ නම : ..........................................................................

ජාතික හැදුනුම්පත් අංකය : ..........................................

අත්සන : ..........................................

දිනය : ..........................................

20 .......................... මස .............. දින මා ඉදිරියේ දිවුරන ලදි / ප්‍රතිඥා දෙන ලදි

..........................................

දිව්රුම් කොමසාරිස් / සාමදාන විනිශ්චයකාරතුමාගේ අත්සන සහ මුද්‍රාව.

මණ්ඩලයේ බලයලත් නිළධාරියාගේ නම : ..........................................................................

| | | | |
|---|---|---|---|
| .................................... | .................................... | .................... | .................... |
| අත්සන | ජාතික හැදුනුම්පත් අංකය | දිනය | නිල මුද්‍රාව |